# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

**2020 පෙබරවාරි**

වෙළුම **02** නිකුතුව **02**


## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





2020 පෙබරවාරි මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 988 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.7 කින් සුළු වශයෙන් ඉහළ ගියේය.

### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2020 පෙබරවාරි මාසයේදී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,562 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 9.1 කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




2020 වසරේ පළමු මාස දෙක තුළදී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 1.3 කින් පහළ ගිය අතර ආනයන වියදම සියයට 6.8 කින් ඉහළ ගියේය.


### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





වෙළඳ හිඟය 2019 පෙබරවාරි මාසයේ පැවති එ.ජ. ඩොලර් මිලියන 451 ට සාපේක්ෂව 2020 පෙබරවාරි මාසයේදී එ.ජ. ඩොලර් මිලියන 574 දක්වා පුළුල් විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2020 ජන. - පෙබ.)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)





### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

**අපනයන ක්‍රියාකාරිත්වය (ජන. - පෙබ.)**




**අපනයන පරිමා දර්ශකය (ජන. - පෙබ.)**





ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික සහ ඛනිජ අපනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු මාස දෙක තුළදී අපනයන ආදායම පහත වැටුණු අතර කාර්මික අපනයන සුළු වශයෙන් ඉහළ ගියේය.


කාර්මික අපනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු මාස දෙක තුළදී අපනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


**කෘෂිකාර්මික අපනයන ආදායම**





**කෘෂිකාර්මික අපනයන පරිමා දර්ශක සහ මිල දර්ශක**




**කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - පෙබ.)**




**තේ සහ රබර් මිල ගණන් ***





*කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වේ


ප්‍රධාන වශයෙන් කුළුබඩු, තේ, මුහුදු ආහාර සහ පොල් අපනයන පහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු මාස දෙක තුළදී කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. කෙසේ වෙතත්, සලකා බලන කාලපරිච්ඡේදය තුළදී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ ස්වාභාවික රබර් අපනයන ආදායම ඉහළ ගියේය.

# කාර්මික අපනයන


කාර්මික අපනයන ආදායම





කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය
(ජන. - පෙබ.)





නැව් හා ගුවන් යානා ඉන්ධනවල
අපනයන මිල ගණන්





2020 වසරේ පළමු මාස දෙක තුළ දී කාර්මික අපනයන ආදායම සුළු වශයෙන් ඉහළ ගිය අතර රෙදිපිළි හා ඇඟලුම් සහ ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ඉහළ යෑම එයට හේතු විය.

# ආනයන ක්‍රියාකාරිත්වය

ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - පෙබ.)





ආනයන පරිමා දර්ශකය
(ජන. - පෙබ.)





2020 වසරේ පළමු මාස දෙක තුළ දී ආනයන වියදම ඉහළ ගිය අතර සියලු ප්‍රධාන ආනයන කාණ්ඩවල වියදම් ඉහළ යෑම එයට හේතු විය. මේ අතර සියලු ප්‍රධාන කාණ්ඩවල ආනයන පරිමා ඉහළ යෑම හේතුවෙන් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී ආනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - පෙබ.)





සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ සාමාන්‍ය ආනයන මිල ගණන්





විශේෂයෙන් කිරි නිෂ්පාදිත, එළවළු සහ සීනි වැනි ආහාර වර්ග සහ පෞද්ගලික රථවාහන හා බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත වැනි ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ වැනි බොහෝ කාණ්ඩවල ආනයන ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු මාස දෙක තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වෙතත් මෙම කාලපරිච්ඡේදය තුළ දී මුහුදු ආහාර සහ විලවුන් වර්ග හා සේදුම් ද්‍රව්‍ය ආනයන වියදම පහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන


අන්තර් භාණ්ඩ ආනයන වියදම





අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - පෙබ.)





බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන්
(මාසික සාමාන්‍ය අගයන්)





ප්‍රධාන වශයෙන් ඉන්ධන, ආහාර සැකසුම්, රබර් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන ඉහළ යෑම හේතුවෙන් **2020** වසරේ පළමු මාස දෙක තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. කෙසේ වුවද, මූල ලෝහ, තිරිඟු හා ඉරිඟු සහ රථවාහන හා යන්ත්‍රසූත්‍ර කොටස් ආනයන වියදම පහත වැටුණි.

## ආයෝජන භාණ්ඩ ආනයනය


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය
(ජන. - පෙබ.)




ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම පහත වැටීම හමුවේ වුවද ප්‍රධාන වශයෙන් යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ සහ ප්‍රවාහන උපකරණ ආනයන ඉහළ යෑම හේතුවෙන් 2020 වසරේ පළමු මාස දෙක තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

## විදේශීය වෙළඳාම - සාරාංශය

### අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | පෙබ.- 19 | පෙබ. - 20 | වෙනස (%) | ජන. - පෙබ. 2019 | ජන. - පෙබ. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **207.8** | **195.1** | **-6.1** | **415.4** | **383.8** | **-7.6** |
| එයින් | තේ | 110.6 | 107.8 | -2.5 | 221.4 | 207.5 | -6.2 |
| | පොල් | 27.3 | 26.2 | -4.3 | 53.0 | 50.7 | -4.4 |
| | කුළුබඩු | 28.6 | 18.7 | -34.7 | 56.4 | 38.1 | -32.4 |
| | මුහුදු ආහාර | 25.3 | 20.6 | -18.8 | 52.7 | 44.2 | -16.1 |
| **කාර්මික අපනයන** | | **769.5** | **790.0** | **2.7** | **1,595.9** | **1,602.6** | **0.4** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 465.6 | 468.1 | 0.5 | 941.5 | 942.2 | 0.1 |
| | රබර් නිෂ්පාදිත | 69.7 | 71.5 | 2.6 | 150.3 | 141.7 | -5.7 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 38.6 | 57.8 | 50.0 | 76.0 | 140.6 | 84.9 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 35.5 | 36.6 | 3.1 | 88.6 | 72.1 | -18.6 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 32.2 | 34.8 | 7.9 | 69.1 | 65.3 | -5.5 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 27.1 | 21.3 | -21.3 | 51.2 | 46.0 | -10.1 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 10.6 | 7.3 | -30.5 | 23.7 | 12.9 | -45.5 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **3.8** | **3.3** | **-13.3** | **7.9** | **6.9** | **-13.1** |
| **මුළු අපනයන** | | **981.1** | **988.4** | **0.7** | **2,019.3** | **1,993.3** | **-1.3** |

### ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | පෙබ.- 19 | පෙබ. - 20 | වෙනස (%) | ජන. - පෙබ. 2019 | ජන. - පෙබ. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **259.9** | **327.3** | **25.9** | **560.4** | **699.0** | **24.7** |
| ආහාර හා පාන වර්ග | | 85.7 | 135.8 | 58.5 | 196.9 | 283.4 | 43.9 |
| එයින් | සහල් | 1.0 | 1.4 | 40.6 | 3.3 | 3.6 | 7.0 |
| | කිරිපිටි | 4.8 | 26.4 | 445.9 | 21.6 | 61.0 | 183.0 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 174.2 | 191.4 | 9.9 | 363.5 | 415.7 | 14.3 |
| එයින් | පෞද්ගලික රථවාහන | 48.1 | 53.6 | 11.3 | 97.7 | 116.9 | 19.7 |
| **අන්තර් භාණ්ඩ** | | **831.0** | **911.5** | **9.7** | **1,787.1** | **1,846.0** | **3.3** |
| එයින් | ඉන්ධන | 281.8 | 418.7 | 48.6 | 610.8 | 710.6 | 16.3 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 212.2 | 182.0 | -14.2 | 474.7 | 482.8 | 1.7 |
| | පොහොර | 5.3 | 13.2 | 148.8 | 9.1 | 19.2 | 111.9 |
| | තිරිඟු හා ඉරිඟු | 26.7 | 8.4 | -68.5 | 41.2 | 17.3 | -58.0 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **341.5** | **323.6** | **-5.2** | **740.3** | **752.7** | **1.7** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 193.9 | 183.5 | -5.4 | 425.1 | 442.1 | 4.0 |
| **මුළු ආනයන** | | **1,432.4** | **1,562.3** | **9.1** | **3,087.9** | **3,297.7** | **6.8** |

### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | පෙබ.- 19 | පෙබ. - 20 | වෙනස (%) | ජන. - පෙබ. 2019 | ජන. - පෙබ. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| වෙළඳ ශේෂය | -451.3 | -573.9 | | -1,068.6 | -1,304.3 | |

### වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (අ)

| කාණ්ඩය | | පෙබ.- 19 | පෙබ. - 20 | වෙනස (%) | ජන. - පෙබ. 2019 | ජන. - පෙබ. 2020 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| අපනයන | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 136.6 | 137.6 | 0.7 | 140.5 | 138.7 | -1.3 |
| | පරිමා දර්ශකය | 127.3 | 133.9 | 5.2 | 136.8 | 142.2 | 4.0 |
| | මිල දර්ශකය | 107.3 | 102.8 | -4.2 | 102.8 | 97.6 | -5.1 |
| ආනයන | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 128.2 | 139.9 | 9.1 | 138.2 | 147.6 | 6.8 |
| | පරිමා දර්ශකය | 143.2 | 157.5 | 10.0 | 152.2 | 165.3 | 8.6 |
| | මිල දර්ශකය | 89.5 | 88.8 | -0.8 | 90.8 | 89.3 | -1.6 |
| වෙළඳ මිල අනුපාතය | | 119.8 | 115.7 | -3.5 | 113.2 | 109.2 | -3.5 |

(අ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද